# ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව

## කොන්ත්‍රාත් පදනම මත කාර්මික නිලධාරීන් බඳවා ගැනීම

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ නුවරඑළිය, පුත්තලම, බදුල්ල, මුලතිව්, කිලිනොච්චිය යන දිස්ත්‍රික්ක සඳහා දැනට පුරප්පාඩුව පවතින කාර්මික නිලධාරී තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අධ්‍යාපන සුදුසුකම්**

සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයන් හයකින් (06) කින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.

සහ

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය ගණිතය විෂය ධාරාවෙන් ශුද්ධ ගණිතය / ව්‍යවහාරික ගණිතය / සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව හෝ තාක්ෂණවේදය විෂය ධාරාවේ ඉංජිනේරු තාක්ෂණවේදය හා තාක්ෂණවේදය සඳහා විද්‍යාව ඇතුළුව විෂයන් තුනකින් එකවර සමත් වීම.

**වෘත්තීය සුදුසුකම්**

I. මොරටුව විශ්වවිද්‍යාලයේ හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව (සිවිල්) හෝ

II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (සිවිල්) හෝ

III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව (සිවිල්) හෝ

IV. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්) හෝ

V. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කර තිබීම (සිවිල්) හෝ

VI. රැකියා ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය කුසලතාවය (NVQ - 06) මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම (සිවිල් අංශයෙන්) හෝ

VII. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම් සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් (සිවිල් අංශයෙන්) ලබා තිබීම.

**ඉටුකර ගැනීමට අපේක්ෂිත කාර්යයන්**

I. නව ජල ව්‍යාපෘතීන්හි සැලසුම් සැකසීම / ඇස්තමේන්තු සැකසීම / පරීක්ෂා කිරීම

II. දැනට පවතින ව්‍යාපෘති පුනරුත්ථාපනය / වැඩිදියුණු කිරීම

III. වැසි ජලය එක්රැස් කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

IV. ඉදිකිරීම් අධීක්ෂණය

**සාමාන්‍ය කොන්දේසි**

I. වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත මෙම තනතුරට බඳවා ගනු ලැබේ. (සේවා අවශ්‍යතාවය හා ඔබගේ සේවා කාර්යක්ෂමතාවය අනුව කාලය දීර්ඝ කිරීමට අවකාශ ඇත.)

II. අයදුම්කරුවන් පුරප්පාඩු පවත්නා දිස්ත්‍රික්කවල වසර 03 ක ස්ථිර පදිංචියක් සහිත අය විය යුතු අතර එම දිස්ත්‍රික්කවලම සේවය කිරීමට එකඟ විය යුතුය. (සම්මුඛ පරීක්ෂණයේදී පදිංචිය තහවුරු කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය අනිවාර්යෙන් ඉදිරිපත් කළ යුතුය.)

III. මෙම පත්කිරීම / අවලංගු කිරීම / සංශෝධනය කිරීම සඳහා බලතල දෙපාර්තමේන්තු ප්‍රධානියා සතුය.

IV. අයදුම්කරුවන් වයස අවුරුදු 18 ත් 45 ත් අතර විය යුතුය. (රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබාගත් අය සඳහා උපරිම වයස අවුරුදු 67 කි.)

**වැටුප**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි MN03 වැටුප් ක්‍රමයේ III ශ්‍රේණියේ 2020-01-01 දිනට ආරම්භක වැටුප හා දීමනා වේ. (ආසන්න වශයෙන් රුපියල් 38,840 ක් පමණ වේ.)

- විශ්‍රාමික නිලධාරීන් සඳහා ගෙවීම් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2018 හි විධි විධාන පරිදි වේ.

ඉහත සුදුසුකම්ලත් අයදුම්කරුවන් නම, ලිපිනය, වයස, අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්, දුරකථන අංකය, විද්‍යුත් තැපැල ආදී

තොරතුරු ඇතුළත් කර තමා විසින් පිළියෙළ කර ගන්නා ලද අයදුම්පතක් 2021-05-17 දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් හා dncws.ad2019@gmail.com යන විද්‍යුත් ලිපිනය මගින් යොමු කළ හැකිය. (ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "කොන්ත්‍රාත් පදනම මත කාර්මික නිලධාරීන් බඳවා ගැනීම............................ දිස්ත්‍රික්කය" ලෙස සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව,**
**අංක 1114, පන්නිපිටිය පාර,**
**තලවතුගොඩ.**
**2021-04-30 වන දින,**

**දුරකථන 011-2775861**

Source: Dinamina, Daily News (2021.04.30)